ශ්‍රී. බු. ව. 2558 ක්වූ දුරුතු මස කලාපය, රාජ්‍ය වර්ෂ 2015 ක් වූ ජනවාරි මස 04 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

## ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

## නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

## (ඛුද්දක නිකාය - ධනිය සූත්‍රය ඇසුරිනි)




ධම්කාමී සත්පුරුෂයෙනි,

අද දුරුතු පුර පසළොස්වක පොහොය දිනයයි. ක්‍රිස්තු වර්ෂ 2015 වසරේ පළමු පොහොය දිනයයි. මහා කාරුණික තථාගතයන් වහන්සේ තුන් බෑ ජටිල තාපසවරු දමනය කිරීම ප්‍රථම වරට මහියංගනයට වැඩම කිරීම සුමන සමන් දේවතාවාට කේශ ධාතු පිරිනැමීම යන කරුණු සිහිපත් කරන දිනයයි.

අද මාතෘකාව සඳහා තෝරා ගත්තේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායේ ග්‍රන්ථ පහළොවෙන් එක් ග්‍රන්ථයක් වන සුත්ත නිපාතයේ උරග වග්ගයට අයත් ධනිය සූත්‍රයයි. වර්ෂයක් ආරම්භ වූ හැටියේම බොහෝ දෙනාගේ අදහස වන්නේ සුබ නව වසරකට සැප සම්පත් පිරේවා! යි යන හැඟීමෙන් ආමිස ප්‍රාර්ථනාවන්ය. සමහර විට අද පොහොය දවසෙත් ඇතැමුන් වසරේ පළමු පෝය යන හැඟීමෙන් ඉහත කී සුබ ප්‍රාර්ථනා කරනව ඇති. මෙලොව ලෞකික සැපයෙන් පමණක් සතුටු වූ පොහොසතෙක්

සම්බන්ධව තමයි මේ සූත්‍රය දේශනා කිරීමට හේතු සකස් වූයේ. ඔහුගේ නම ධනිය. දහස් ගනනින් ගවයන් ඇති ගව පාලකයෙකි. ලොකු පොහොසතෙකි, ධනිය ගෝපාල කියලත් කියනව. මේ සූත්‍රයට ද ධනිය ගෝපාල සූත්‍රය කියලත් ව්‍යවහාර කරනව. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටින කාලයේ මහී ගංගාව අසබඩ දක්‍ෂ ලෙස ඔහු තම ගෘහ පාලනය ද කරගෙන අඩුපාඩුවකින් තොරව වාසය කළා.

වැසි කාලයේ එක්තරා දවසක හැන්දෑවේ, දවසේ කටයුතු නිමාකොට ගවයන් ගාල් කොට සේවක කාරකාදීන් ද නිවසට පැමිණ නිවසේ කටයුතු ද නිමාකොට ආහාර ද ගැනීමෙන් පසු සැහැල්ලුවෙන් වාඩි වී සිතට ආ සිතිවිලි මෙසේ ප්‍රකාශ කරනව.

බත් උයල අනුභව කරල ඉවරයි. දෙනුන්ගෙන් කිරි දොවා අවසන්. සතුන්ටද කවා පොවා සේවකයන් ද පැමිණියා. දැන් සවස් යාමය. මහී ගඟ අසබඩ නිවසේ සේවකාදීන් ද ගෙදරට ඇවිත් වහලය ද හොඳින් සෙවිලි කර ඇත. ගිනිකබල දල්වා ඇත. "අථ චේ පත්‍ථයසි පවසස දෙව" දැන් ඉතින් වැස්ස කැමති නම් වහින්න.

ධනිය ගෝපාල කියූ මේ ප්‍රකාශය සැවැත් නුවර වැඩ සිටි බුදුහිමියන්ට ඇසුනා. පිහිට විය යුත්තෙක්ය යන දැකීම උන්වහන්සේ බුදු නුවණින් දුටුව මහී ගඟෙන් එහා පැත්තෙ කන්දට වැඩම කලා. උන්වහන්සේ එහි වැඩ සිට ගාථාවකින් මෙහෙම කියනව.

මම කෙළෙස් හුල් ගලවා දමා, නොකිපෙන ස්වභාවයෙන් මහී ගංතෙර තනිවම කිසිවෙක් නැතිව වාසය කරමි. මගේ කුටිය නිරාවරණයි. (කෙළෙස් නැති කමෙන්) රාගාදී ගිනි එකොළහම නිවා දමල. ඒ නිසා ගිනි පත්තුවෙන්නේද නැත. නිවෙන්න පත්තු වෙන්න ගින්නක් මට නැත. ඉතින් වැස්ස කැමති නම් වහින්න.

ඉන්පසු ගෝපාල නැවත කියනව මගේ නිවස මැසි මදුරු උවදුරු නැත. තණකොළ හොඳින් වැවුනා වූ දෙණිකඩෙහි ගවයන් සිත්සේ තණකොළ කමින් ඉන්නව. එබැවින් වැස්ස ද ඔවුන්ට බාධා නොවේ. මහාමේඝය ! කැමතිනම් වහින්න යනුවෙන් ආමිස සුවය ප්‍රකාශ කරනව.

බුදුහිමියන් තම නිරාමිස සුවය ඉන්පසු නැවත ද මෙසේ ප්‍රකාශ කරනව. මම හොඳින් සකස් කරගත් (ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්‍ග නැමැති දඬු වලින් ශ්‍රද්ධා නැමැති රැහැනින් බැඳි) පහුර මගින් සතර ඕඝ තරණය කර එතෙර වී අවසානයි. දැන් මට පහුර ද වැඩක් නැත. මම සසරින් ගොඩවී අවසානයි. කැමති නම් වැස්ස වහින්න මම (ඕඝ නැමැති) සැඩ පහරින් ගහගෙන යන්නෙ නැත.

ඉන්පසු ධනිය මෙසේ කියනව මගේ බිරිඳ මට කීකරුයි. බොහෝ කාලයක් තිස්සේ මනාපයෙන් වාසය කරන්නෙ. ආහාරපාන වලට කෑදරද නැත. ඇය පවු කරන්නේ ද නැත. වැස්ස කැමතිනම් වහින්න මම ඉන්නෙ සතුටින්.

ඊට ගැලපෙන ගාථාව බුදුහිමියන් පවසනව. මගේ සිත මට කීකරුයි. (කෙළෙසුන් කෙරෙන් මිදී ඇත.) දීර්ඝ කාලයක් තිස්සේ පුහුණු කල හිතකි. හොඳින් දමනය වී ඇත. එබැවින් පව් කරන්නේ ද නැත. (කර්ම රැස් කරන්නේ ද නැත) වැස්ස ඕනෑතරම් වහින්න මට කමෙක් නැත.

ධනිය මෙහෙම කියනව. මම මහන්සියෙන් වැඩකරල හම්බ කරනව. එයින් සතුටුවෙල ඒ වැටුපෙන් සතුටින් ජීවත් වෙනව. මගේ දරුවොත් මා සමගම හම්බකිරීමේ නිරත වෙලයි ඉන්නෙ. ඔවුන් නිරෝගියි. වැරදි නැහැ කීකරුයි. ඒ සතුට මට තියෙනව.

ඊළගට භාග්‍යවතුන් වහන්සේ නිරාමිස සුවය ප්‍රකාශ කරනව. මම කාටවත් බැළ මෙහෙවර නොකරමි. සසරදී අනන්තව ලෝකයට බැළ මෙහෙවර කරමින් භවයෙන් භවය තණ්හා දාසව ආවෙමි. ඒ බැඳීම් දාස කම් වලින් මම මිදුනෙමි. බැඳීම් වන දරුවන් ද ඔවුන් යෙදවීමක් හෝ ඒ නිසා හදාගත් තාවකාලික සතුටක් ද නැත. නිරාමිස සතුටින් කල්ගෙවමි. වැස්ස කැමති නම් වහින්න.

ඉන්පසු ධනිය මෙසේද කියනව. මට තරුණ වස්සන් ද ඇත. කිරිබොන පැටවුන් ද ඇත. පැටවුන් ලැබෙන්න ඉන්න සතුන් ද ඇත. ගව මණ්ඩලයට ගව රාජයන් ද ඇත යනුවෙන් වත්කම් ප්‍රකාශයක් කරනව.

තථාගතයන් වහන්සේ ඊට පිළිතුරු ගාථාවකින් ධනියට ප්‍රකාශ කරනව. මට තරුණ වස්සොත් නැහැ. කිරි බොන පැටවුද ගැබිනි දෙන්නු ද නැත. ගව පරපුර පැවැත්මට දෙන්නු ද ගව රජුන් ද (ගවම්පති වෘෂභයින්) නැත. ඒ නිසා වැස්ස කැමති නම් වහින්න. මට කම් නැත.

ධනිය ඊළඟ ගාථාවෙන් ප්‍රකාශ කරනව ගවයන් බැඳීමට නොසෙල් වෙන කණු සිටුවා ඇත. අළුත් රැහැන් පටින් ගවයෝ බැඳ ඇත. කිරි බොන වස්සන්ට ඒවා කැඩිය නොහැකිය. කිරි බීමට මවු වැස්සිය ළඟට යා නොහැකිය. ඒ නිසා මම සතුටිනි වැස්ස කැමති නම් වහින්න.

තථාගතයන් වහන්සේ ඊට ද ගාථාවකින් පිළිතුරු දේශනා කරනව. බැඳීම් කඩාගෙන යන වෘෂභයෙකු සේ ද පූතිලතාවකින් (මහත රසකිඳ වැල) බඳින ලද

හස්තියෙකු එය කඩාගෙන යන ලෙසින් මම නැවත මවුකුසට නොඑමි. "නාහං පුන උපෙසසං ගබභ සෙය්‍යං"

ඒ ගාථාව බුදු හිමියන් දේශනා කරනවත් සමගම වල ගොඩ පුරවමින් මහා වැසි ඇදහැලුන බව සූත්‍රයේ දැක්වෙනව. ඒ වැසි හඬත් බුද්ධ වචනයත් හඳුනාගත් ධනිය මෙහෙමත් කියනව. අපිට සිද්ධ වුනේ අල්ප නොවූ ලාභයක් අපිට භාග්‍යවතුන් වහන්සේ දකින්න ලැබුන ස්වාමීනි ! ඔබ වහන්සේ සරණ කොට යන්නෙමු. අපට ඔබ වහන්සේ ශාස්තෘ වන සේක්වා. මට කීකරු මගේ බිරිඳත්, මමත් අපි දෙදෙනාම අද පටන් ඔබ වහන්සේට කීකරු වන්නෙමු. එසේ වී ජාති ජරා මරණාදී දුකින් මිදී එතෙර වන්නෙමු. මේ සම්පත් සදාකාලික සැපයක් යයි සිතා සිටි දුකින් අත් මිදෙමි යි කීය. මේ විදියට ප්‍රකාශ කර ධනිය, බිරිඳ, දූ දරුවන් බුද්ධ ශ්‍රාවක බවට පත්වුනා.

වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා මෙතැනට ඇවිත් මාර කථාවක් කියනව. ඒ සඳහා මාරය තෝරා ගත්තේ නැවත මාරයාගේ පැත්තට ධනිය ඇද ගැනීමේ රස දැනෙන මාතෘකාවක් අදත් වැඩියෙන්ම කාගෙත් හිත ඇදී යන මාර වූ රස වූ කථාවක්.
"දරුවො ඇති අය දරු සම්පත් හේතුකොට ගෙන සතුටු වෙනව. ගවයන් ඇති ගව හිමියො ගව සම්පත් හේතු කොට ගෙන සතුටු වෙනව. මනුස්සයෙකුට ඒ සියලු උපධීන් (දූ දරු ආදී සම්පත්) සතුටට හේතු වෙනව. යමෙකුට ඒ සම්පත් නැතිද ඔහුට සතුටක් නැත."

මේ මාර කථාවටත් භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු සැපයූහ. "දරුවො ඇති අය ඒ දරුවන් හේතු කොට ගෙන නැවත නැවත ශෝක කරනව. ගවයන් ඇති අය නැවත නැවත ගවයන් හේතුවෙන් ශෝක කරනව. දුක් විඳිනව. මනුෂ්‍යයාට ඒ සියලු උපධීන් (සම්පත් යයි සිතන දේ) ශෝකයට හේතු වෙනව. යමෙක් ඉහත කී උපධි නැති කරයිද ඒ හේතුවෙන් ඔහු ශෝක නොකරයි" යනුවෙන් මාරයාට පිළිතුරු වදාළහ.

නව වසරක් ආරම්භ වූ මේ මොහොතේ උදාවූ පෝය දවසෙ වසර පුරාවට ශෝක නොකිරීමට මේ ධනිය සූත්‍රය උපයෝගී කරගනිමු. මේ සූත්‍රයේ කියන විදියට උපධීන් යනු අපි වසරට සුභ පතන වචන තුළ ඇති අර්ථයයි. "ලැබූ නව වසර කිරියෙන් පැණියෙන් ඉතිරේවා" යි යන අදහසයි. ධනිය ගෝපාලත් තම ගෝපිකාව සහ දූ දරු සේවකාදීන් සමග කිරියෙන් පැණියෙන් ඉතිර පැතිර සිටි බව දැක්වෙනව. මෙවන් ධනිය ගෝපාල චරිත අදත් සමාජයේ ඉන්නව. යමක් හම්බකරගත් පසු හිතනව ඒක තමයි ලොව ඇති එකම සැපය යනුවෙන්. අපි හැමෝටම මේ සම්පත් අවශ්‍යයි. එනමුත් ජීවිතයේ අරුතද දැන සීමා නොඉක්මවා සම්පත් විඳීම වඩාත් නිවැරදි ක්‍රමය බව පෙන්වා දුන්නේ භාග්‍යවතුන් වහන්සේ පමණි. ජීවිතය දිගු සසර

ගමනකි, මේ එක නවාතැනක් පමණි, අම්බලමකි, ගමන දිගයි, කෙළවරක් නැත, සැපයක් යයි හැඟීමක් පමණක් සත්වයාට දී ඇත. එබැවින් තාවකාලික සුවයන්ට රැවටී ඒ පහස නිසාම නැවත නැවත ගමනේ යෙදෙනව. සැපය යනු නිදහසයි. සම්පත් ගොඩකට හිරවීම නොවේ. මේ බව දන්නේ කී දෙනෙක්ද?

ධනියගෙ ප්‍රකාශය තුළ කියන්නෙ ඒ තාවකාලික සුවයයි. සවස් වන විට ගෙදරට ආව. බත් උයල කාල ගිනි දල්වල දූ දරුවන් සේවකයො ඇවිත් දැන් වැස්ස වහින්න බුදුහාමුදුරුවො පෙන්වා දෙනව ඒවා තාවකාලිකයි. මම රාග ද්වේශ මෝහ ආදී ගිණි එකොළහම නිවල වැස්සත් නොවැස්සත් දෙකම එකයි. බුදුහාමුදුරුවො පෙන්වා දෙනව සහ මුලින් ගිනි නිවන විදි සහ කෙළෙස් උල් ගලවන විදි. ක්‍රෝධය දුරලන විදි. වේදනා ඇති නොවන විදි.

දෙවෙනි ගාථාවෙන් ධනිය කියනව. නිවසේ මැසි මදුරුවන් නැති බවත් ගවයන්ට අවශ්‍ය ආහාරද සම්පූර්ණ බවත් වැස්ස කැමති නම් වහින්න. බුදුහිමියන් ඊට පිළිතුරු දෙනව. සැඩ පහර තරණය කළා. පහුරක් මගින්, ඒ මාර්ග අංග අටයි. මධ්‍යම ප්‍රතිපදාවයි. අපේ ජීවිතයට සැප සම්පත් එපා කියන වචනය බුදුහාමුදුරුවො පාවිච්චි කළේ නැත. ධනියට කීවේ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනයෙන් එතෙර වන විදි යයි කෙටියෙන් සරළව කියනවනම් යාන වාහන දූ දරු ඉඩකඩම් වතුපිටි ආදිය සමග ඇලීම සහ ගැටීම ඇතිකර නොගැනීමයි. එසේ නොකරන්නාට ශෝක ඇති වන බවයි.

ධනිය ගෝපාල හොඳ ස්වාමියෙක් හැටියට බිරිඳගේ කීකරු භාවය ප්‍රකාශ කරනව. එයට බුදුහිමියන් පිළිතුරු දෙනව. මම දීර්ඝ කාලයක් බැඳීම නැති කිරීමට අත් හැරීමට කෙළෙස් වසඟ භාවයෙන් මිදීමට පුහුණු කළා දමනය කළා යනුවෙනි.

එමෙන්ම ධනිය කියනව. මම වෙහෙස මහන්සි වී දරුවන් සමග ධනය උපයා ඒ වැටුපෙන් ජීවත් වෙන බව. බුදුහිමියන් පෙන්වා දෙනව මමත් සසර අනන්තව ලෝකයට බැළ මෙහෙවර කළා. එයින් මිදුනා. එතෙකින් නොනැවතුන ධනිය ගෝපාල තම ගව සම්පතෙහි වත්කම් ප්‍රකාශයක් කරනව. ඒ සඳහා බුදු හිමියන් සසර පැවැත්ම දුකක් නිසා එයින් මිදී නැවැත්ම පරතෙර දුටු බව වදාරණව. ධනිය ඊළඟට ප්‍රකාශ කරනව ගවයන් බැඳ ඇති ආකාරයත් ඒ වර පටත්, එහි නොසිඳෙන ශක්තියත්, මේ සමාන අදහස් ඇති අය මිනිස් සමාජය තුළ කොපමණ ඇත්ද?. භාග්‍යවතුන් වහන්සේ ඊට දෙන පිළිතුර වූයේ ගවයෙක් වර පට කඩාගෙන යන්නා සේ ඇතෙක් පූතිලතා නම් වැල කඩා යන්නා සේ පැටිය මවුදෙන ළඟට යන ගමනට සමාන වූ නැවත ගැබක නිදන තත්වයෙන් මම මිදුනෙමි යනුවෙනි. ධනිය කරුණු අවබෝධ කරගත්තා. මේ පැමිණ සිටින්නේ සියළු කෙළෙසුන්ගෙන් මිදුණු භාග්‍යවතුන් වහන්සේ

බව තේරුම් ගත්තා. "අපිට මහත් ලාභයක් ඇති වුනා" යයි ප්‍රකාශ කළා. දැන් ඔහුට තේරෙනව ලෞකික ලාභ හරයක් නැති බව. ධනිය තෙරුවන් සරණ ගියා. ඊළඟට වැදගත් වන්නේ මේ කථාවෙන් ධනිය ජය ගනීවි යනුවෙන් බලා සිටි මාරයාගේ මාර කථාවයි. මාරයා කල්පනා කරනව දරුවන් සහ සම්පත් ගැන මතක් කරමින් නැවත ධනිය ඒ තුළට යොමු කරගන්න. බුදුරජාණන් වහන්සේ එයට ද මෙසේ වදාළා. පුතුන් ඇති අය ඒ නිසාම ශෝක කරනව මොනම සැපක් වින්දත් දරුවන් ලෙඩ වෙනව, තමන් සිතන පරිදි පවතින්නේ නෑ. මැරෙනව, දෙමාපියෝ ලෙඩවෙනව, මැරෙනව, විවිධ දුක් වලට භාජනය වෙනව. ගව සම්පතත් එහෙමයි. ගවයෝ ලෙඩ වෙනව, මැරෙනව, හොරු ගන්නව, ස්වාභාවික විපත් වලට හසුවෙනව, කලක් යනවිට සම්පත් වල පැවැත්ම කරගෙන යන්න බැරිව බලාපොරොත්තු සුන්වෙනව. එවිට දුකක්මයි. ඒවාට නොඇලී ජීවත් වන තැනැත්තාට ශෝක නැත. එතැනදීත් මාරයා පරාජය වුනා.

උපධි යනු සම්පත් නම් ඒ සම්පත් දුකක් බවයි බුදුහිමියන් වදාළේ. අපි ආධ්‍යාත්මික සහ භෞතික සම්පත් නිසා දුක්වෙන අවස්ථා අපමණයි. ගිහි හෝ පැවිදි වේවා මනුෂ්‍යයින්ට උපධීන් දුකක්මයි. උපන් සත්වයාට විවිධ පදවි තනතුරු නම්බුනාම හැකියාවන් ඇති වුවද එය උපධි සම්පත්ය. ඒවා කලකදී දුකක් වෙනව. මෙය ලෝකයේ ස්වභාවයයි. එසේ නොවන බව මාරයාගේ අදහසයි. මාරයා මහී ගංතෙර පමණක් නෙවි. නිවස තුළත් ඇත. හැම සම්පතක් තුළම ඇත. ලෝකයේ හැමවිටම මාරයා හඳුනාගත නොහැකිය. එයට ප්‍රඥාව අවශ්‍යයි. හැම විටම බුදු හිමි සහ උන්වහන්සේගේ දහම දැකගත නොහැක. ඊට බාධා කරන මාරයෝ බොහෝය. ඒ සඳහාද ප්‍රඥාව අවශ්‍ය වේ.

යමෙක් යමකට අනවශ්‍ය ලෙස බැඳීම් ඇති කරගනීද ඔහුට "උපධීහි නරසස සොචනා" එය දුකකි. යමෙක් යමකට බැඳීම් ඇති කර නොගනීද ඔහුට "නහිසෝ නන්‍දති යො නිරූපධී" දුක් නැත. එබැවින් බුදුසරණ ගිය ධනිය ගෝපාලයෙක් වීමට ද සම්මත නව වසරේ උපධීන් කෙරෙහි අනවශ්‍ය බැඳීම් ඇතිකර නොගැනීමට ද දුක් නොවූ සුබ දායක නව වසරකට ආසිරි තෙරුවන් බෙළෙන් ලැබේවා! යි ද හැකි ඉක්මනින් බුදුවරුන් ප්‍රශංසා කළ උතුම් නිවනට පත්වීමට ද අදිටන් කර ගනිමු.